වවුනියාවේ තෝනික්කල් ප්‍රදේශයේ උපන්දින සාදයක් පැවැති නිවසකට ජූලි 23, 2023 දින අලුයම කඩාවැදුණු පිරිසක්, .නිවසේ සිටි අයට පහර දී නිවසට ගිනි තැබීම නිසා නිවසේ සිටි පිරිස් තුවාල ලබා, කාන්තාවක් මිය යෑමේ පුවත, මාධ්‍ය තුළ ආවරණය වී තිබිණි.

ඒ සම්බන්ධයෙන් විශේෂාංග ලිපියක් ඉදිරිපත් කරන සතිඅග අරුණ පුවත්පත (අගෝස්තු 06, 2023) එම සිදුවීම වාර්තා කර ඇත්තේ මේ අයුරිනි.

සිරස්තලය - "චරිත සහතික හොඳ නැති නිසා මරණ සහතික ලියැවෙයි" (සිද්ධියට සම්බන්ධ කාන්තාවක් "රූමත්" යැයි අන්තර්ගතය තුළ දැක්වේ).

ඔබ සිතන ආකාරයට,

1) මෙම සිරස්තලය ඔස්සේ, සිදුවීම සම්බන්ධයෙන් මියගිය පිරිමියාට දොස් පැවරීමක් සහ, ඒ ඔස්සේ මෙම සිදුවූ ඝාතනය සාධාරණීකරණය කිරීමක් නොපෙනෙන්නේ ද? එවැනි සිරස්තලයක් ඔස්සේ, සමාජයට සන්නිවේදනය වන පණිවුඩය ගැටලුකාරී නොවේද?

2) එසේම මෙම සිද්ධියට සම්බන්ධ කාන්තාවකගේ බාහිර ස්වරූපය ("රූමත්" බව) මෙම පුවතට කෙතරම් අදාළ වන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!